

# මානව හිමිකම් 2 කොටස

# මිත්‍යාව සහ යථාර්ථය

ඉරිදා ජාතික පුවත්පත

කාලීන විමසුම

මොහාන් සමරනායක

මානව හිමිකම් යන පදය භාවිත නොවුණ ද ඉන් අර්ථ ගැන්වෙන මූලධර්ම සහ වටිනාකම් සියලු ආගමික ඉගැන්වීම්වල, දේශපාලන චින්තන ධාරාවල, ශ්‍රේෂ්ඨ කලා කෘතිවල සහ අයුක්තියට එරෙහි ව මිනිසා කළ සෑම අරගලයක ම විසිරී ගැබ් ව තිබිණ. එසේ වුව ද මානව හිමිකම් යන පදය නිර්මාණය කොට එය මෑත කාලීන ඉතිහාසයේ ප්‍රධාන සංවාද මාතෘකාවක් බවට, ප්‍රබල දේශපාලන අවියක් බවට සහ ගෝලීය කතිකාවක් බවට පත්කරනුයේ වැඩවසම් ක්‍රමය යටපත් කොට බිහි වූ ධනේශ්වර සමාජ ක්‍රමයේ පුරෝගාමීන් විසිනි. මානව හිමිකම් පිළිබඳ අපේ පළමු වැනි ලිපියෙන් පෙන්වා දුන් පරිදි සෑම ධනේශ්වර විප්ලවයක දී ම මානව හිමිකම් පිළි ගැනීම සහ පිළිපැදීම ප්‍රමුඛ කොන්දේසියක් කොට ගනු ලැබී ය.

1945 ඔක්තෝබර් 24 වැනිදා උපත ලැබූ එක්සත් ජාතීන් යටත් විජිත සහිත අධිරාජ්‍ය ක්‍රමය බිඳ වැටීමෙන් පසු බිහි වූ ලෝකයේ මානව හිමිකම් සංග්‍රහ කිරීම, ලේඛනගත කිරීම, අන්තර්ජාතික සම්මුති සම්පාදනය, විමර්ශනය සහ උල්ලංඝනය නිවැරදි කිරීම භාර ප්‍රධාන ගෝලීය ආයතනය බවට පත්විය. ඇම්නස්ටි ඉන්ටනැෂනල්, හියුමන් රයිට්ස් වොච්, ෆ්‍රීඩම් හවුස් සහ එන්ඩවුමන්ට් ෆෝ ඩිමොක්‍රසි වැනි අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සහ ජාතික රාජ්‍ය නොවන සංවිධාන මානව හිමිකම් ක්ෂේත්‍රයේ සිය ක්‍රියාකාරීත්වය, එක්සත් ජාතීන් විසින් සම්පාදිත මානව හිමිකම් ලේඛන සහ සංවිධානය විසින් ගොඩනගා ඇති මානව හිමිකම් යාන්ත්‍රණය මත පදනම් කොට ගනී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණය මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්, මානව හිමිකම් කවුන්සිලය, මානව හිමිකම් පිළිබඳ විශ්ව වාරික විමර්ශනය, පැමිණිලි කිරීමේ ක්‍රියාදාමය, ඒ ඒ මානව හිමිකම් සම්මුති සඳහා වන විමර්ශන කමිටු සහ විශේෂ විමර්ශකයන් ආදී සංඛ්‍යාවෙන් බොහෝ වූ ශාඛා රාශියකින් සමන්විත ය.

මානව හිමිකම් ව්‍යාපාරය පැතිකඩ ගණනාවකින් මානව සමාජයේ ප්‍රගමනයට ඉවහල් වී තිබේ. එය ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරයි. නන් වැදෑරුම් නිදහස තහවුරු කරයි. මිනිසාගේ නෛසර්ගික අභිමානය ඔහුට අවබෝධ කොට දෙයි. සිය හිමිකම් දිනා ගැනීම සහ රැක ගැනීම සඳහා රට වැසියා ධෛර්යමත් කරයි. වැඩවසම් අවධියේදී ක්‍ෂුද්‍ර ස්ථරයට අයත් නොවූ අතිමහත් බහුතර ජනතාව ගත කළේ අර්ධ වහල්, අර්ධ මනුෂ්‍ය ජීවිතයකි. වඩා දියුණු ධනේශ්වර සමාජයේ වුව ද වරප්‍රසාද රහිත සහ ඌණ වරප්‍රසාදිත ජනයා තමනට උපතින් ම උරුම වූ බොහෝ හිමිකම් අහිමි ව දිවි ගෙවති. මේ පිරිස්වලට සිය අයිතිවාසිකම් හඳුනා ගැනීමටත්, ඒවා භුක්ති විඳීම සඳහා අරගල කිරීමටත් අවශ්‍ය ජවය මානව හිමිකම් ව්‍යාපාරයෙන් ලැබී ඇත.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය 1948 දෙසැම්බර් 10 වැනිදා සම්මත කළ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් මනුෂ්‍යයාට උපතින්ම හිමි සහ කිසිවකුටත් පැහැර ගත නොහැකි අයිතිවාසිකම් 30ක් සංග්‍රහ කොට ලේඛන ගත කරනු ලැබී ය. එහි ඇතුළත් හිමිකම් මනුෂ්‍යයාට භුක්ති විඳීමට හැකිවන අයුරින් ඊට නෛතික බලයක් දෙන අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් දුසිම් දෙකක් පමණ මේ දක්වා සම්මත කොටගෙන තිබේ. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් බහුතරය ඉන් බොහොමයක පාර්ශවකරුවන් වී සිටී. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය, ආර්ථික සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය, ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සහ ස්ත්‍රීනට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් උපකරණ අතර ප්‍රධාන තැනක් ගනී. මේ සම්මුතීන් ඒවාට අත්සන් තබා පිළිගෙන ඇති රටවල අභ්‍යන්තර නීති පද්ධතියට එක්කොට තිබේ. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි එක්සත් ජාතීන් විසින් පිළිගත් මානව හිමිකම් සමහරක් ඇතුළත් කර ඇත.

ශ්‍රී ලංකාවේ 1965-70 අතර ආණ්ඩු සමයේ බලයේ සිටි පාලක පක්ෂයට එරෙහි දේශපාලනයේ නිරත වූයේ යයි චෝදනා කොට ගුරුවරුනට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීනට ඉවසිය නොහැකි තරම් හිරිහැර කරනු ලැබී ය. කිසිදු හේතුවක් නැති ව ගුරුවරු පාසලෙන් පාසලට මාරු කරනු ලැබූහ. ඇතැම් ගුරුවරුන් මාරු කරනු ලැබූයේ බස් රියෙන්, දුම්රියෙන්, සහ බෝට්ටුවෙන් ගමන් කොට පයින් ද යා යුතු ව තිබූ දුෂ්කර පාසල්වලට ය. මේ දේශපාලන පළිගැනීම් ජන්මා කොටගෙන එකල 'ගුරු ශාපය' නමින් ප්‍රදර්ශනයක් පවා සංවිධාන කෙරිණ. එදා ගුරුවරුනට සහ නිලධාරීනට මේ සියලු හිරිහැර සහ දුක් පීඩා විඳ දරාගෙන නිහඬ ව සිටීමට සිදු විය. කිහිප දෙනෙක් දිවි නසා ගත්හ. තවත් අය රැකියා හැර ගියහ.

1994 දී පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පැමිණියේ ය. ඒ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිවරයාගේ නියමයෙන් ගාල්ලේ විදුහලක විදුහල්පතිනිය වෙනත් පාසලකට මාරු කරනු ලැබුවාය. 65-70 ගුරුවරුන් මෙන් ඇය මාරුව ලැබූ පාසලට ගියේ නැත. ඒ වෙනුවට තමාගේ ස්ථාන මාරුව දේශපාලන පළිගැනීමකැයි ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කළා ය. නඩුව විභාග කළ අධිකරණය විදුහල්පතිනියට ලැබුණු ස්ථාන මාරුව දේශපාලන වුවමනාව මත කළ එකක් බව නිගමනය කොට මාරුව අවලංගු කළා පමණක් නොව පැමිණිලිකාරියට රුපියල් විසි දහසක වන්දියක් ගෙවන ලෙස රජයට නියෝග කළේ ය. ඉන් පසු මෙවැනි පැමිණිලි සහ නඩු විභාග සාමාන්‍ය දෙයක් බවට පත්විය. මේ ප්‍රගතිය මානව හිමිකම් ව්‍යාපාරයේ සෘජු ප්‍රතිඵලයකි.

වත්මන් අවධියේ සෑම රටක ම බහුතරය නොවෙතත් සැලකිය යුතු පිරිසක් මනුෂ්‍යයකු වශයෙන් තමාට උරුම අභිමානය ගැන හැඟීමෙන් ඇති ව සිටිති. ජීවත්වීමට, රැකියාවක් කිරීමට, පවුලක් හැදීමට, සමාන ව සහ ගෞරවයෙන් සලකනු ලැබීමට ඇති අයිතිය ඔවුහු හඳුනාගෙන සිටිති. කුමන චෝදනාවකට වුව ද නඩු විභාගයකින් තොර ව දඬුවම් නොකළ හැකි බව ඔවුහු දනිති. මේ අවබෝධය දේශපාලන හා සමාජ ජීවිතයේ දී දැනෙන සුළු බලපෑමක් කරයි. සාමාන්‍ය ජනයා පොලිස් නිලධාරීන්ට පමණක් නොව රජයේ ඉහළ තනතුරු හොබවන අයට ද මහත් සේ බිය වූ කාලයක් තිබිණ. අද තත්ත්වය මුළු මනින් සතුටුදායක නොවුව ද පොලිසිය නිකරුණේ පහර දුනහොත් ගත යුතු පියවර ගැන ජනයාට අවබෝධයක් තිබේ. හිමිකමක් කඩ වූ විට රට ඇතුළත යුක්තිය ඉටු කරගත නොහැකි නම් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණයට පැමිණිලි කිරීමට දැන් අවස්ථාව ඇත.

පසුගිය සියවසේ මැද භාගයේ සිට යටත් විජිත සහිත අධිරාජ්‍ය ක්‍රමය බිඳ වැටීමෙන් පසු විශේෂයෙන් අප්‍රිකාවේ මැද පෙරදිග සහ ලතින් අමෙරිකාවේත් ආසියානු රටවල් සමහරකත් ආඥාදායක ආණ්ඩු බිහිවිය. ඒ රටවල් දීර්ඝ කාලයක් මර්දනකාරී, කෲර හා දූෂිත පාලනයකට නතු ව තිබිණ. සමාජවාදය වැළඳගත් රටවල් සියල්ලේ ම පැවතියේ ජනතාවගේ නන්වැදෑරුම් නිදහස සීමා කළ තනි පක්ෂ පාලනයකි. 90 දශකයේ සිට එවැනි ඒකාධිපති ආණ්ඩු කෙමෙන් බිඳ වැටී නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයට මාරු විය. 1985 දී සාක් හවුල බිහිවන විට ඊට එක්වූ දකුණු ආසියානු රටවල් 7න් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබුණේ ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ පමණි. දැන් සාක් හවුලේ සෙසු ආරම්භක රටවල් පමණක් නොව පසු ව එක්වූ ඇෆ්ගනිස්ථානය ද ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තෝරාගෙන තිබේ. මේ ප්‍රගමනයට ද මානව හිමිකම් ව්‍යාපාරය දායක වූ බව අවිවාදිත ය.

ඉහත දැක්වූයේ මානව හිමිකම් ව්‍යාපාරයේ එක් පාර්ශවයකි. තවත් පාර්ශවයක් තිබේ. එය මිත්‍යාවෙන් හා මායාවෙන් පිරී ඇත. මානව හිමිකම් සම්මුතීන් සම්පාදනය කළ පමණින්, රාජ්‍යයන් ඒවායේ පාර්ශවකරුවන් වූ පමණින්, මානව හිමිකම් තහවුරු කරන දේශීය අණපනත් සම්මත කළ පමණින් සාධාරණ හා සුන්දර සමාජයක් ගොඩනැගෙනු ඇතැයි යන මතයක් ඉතා ප්‍රබල ලෙස සමාජගත කෙරෙමින් පවතී. සිය දේශපාලන ආර්ථික වුවමනාවන් සපුරාගනු පිණිස සෙසු රටවලට බලපෑම් කිරීම සඳහා මානව හිමිකම් අවියක් ලෙස යොදාගන්නා අධිපති රටවල්, ඔවුන්ගේ සැලසුම් අනුව ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණය, අධිපති රටවලින් සැපයෙන අරමුදල්වලින් නඩත්තු වන අන්තර්ජාතික සහ ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා ආදායම් මාර්ගයක් ලෙස ඒවාට සම්බන්ධ වී සිටින බුද්ධිමත්තු හා මාධ්‍යකරුවෝ මේ මිත්‍යාව ප්‍රචලිත කිරීමෙහි පෙරමුණ ගෙන සිටිති. දැන් අපේ පාර්ලිමේන්තුව හමුවේ ඇති තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත එකී මිත්‍යාවේ ම කොටසකි. ජීවත්වීමට, රැකියාවක් කිරීමට, සමාන ව සලකනු ලැබීමට මනුෂ්‍යයාට ඇති මූලික අයිතිය තහවුරු කිරීමට පනත ඉවහල් වන්නේ කෙසේ දැයි පැහැදිලි නැත.

ප්‍රධාන මානව හිමිකම් සම්මුතීන් වන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය රටවල් 167ක් ද, ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය රටවල් 160ක් ද, වාර්ගික වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය රටවල් 175ක් ද, ස්ත්‍රීනට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය රටවල් 187ක් ද, ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය රටවල් 193ක් ද අත්සන් තබා නීතියෙන් පිළිගෙන ඇත. එසේ වුව ද සම්මුතිවල ඇතුළත් මානව හිමිකම් භුක්ති විඳීමට ප්‍රායෝගික ව හැකි වී ඇත්තේ මේ රටවල ජනගහණයෙන් ඉතා කුඩා ප්‍රතිශතයකට පමණි. ලෝකයේ රටවල් අතර සහ රටවල් ඇතුළත ඇති නැති පරතරය අවුරුදු පතා වැඩිවෙමින් පවතී. මේ වසරේ ජනවාරි මස ස්විට්සර්ලන්තයේ දාවෝස් නුවර පැවැති ලෝක ආර්ථික සංසද සමුළුවට ඔක්ස්ෆෑම් ආයතනය ඉදිරිපත් කළ වාර්තාවකට අනුව ලෝක ජනගහණයෙන් සියයට එකක් දෙනා සතු ධනය ඉතිරි සියයට අනූනවය සතු ධනයට සමාන ය. කොතෙක් මානව හිමිකම් ලේඛන ඇතත් අප ජීවත් වනුයේ එවන් දැවැන්ත ආර්ථික සමාජ විසමතාවක් සහිත අසාධාරණ ලෝකයක ය.

1978 දී ක්‍රියාත්මක වූ අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළත් කෙරිණ. සෑම දරුවකුට ම මහා අධ්‍යාපනයක් ලැබීමටත් පාසලකට ඇතුළුවීමටත් ඇති අයිතිය ඉන් තහවුරු කර තිබේ. එහෙත් අද දවසේත් දරුවකු සතුටු දායක අධ්‍යාපනයක් ලැබිය හැකි පහසුකම් සහිත පාසලකට ඇතුළත් කිරීම දූෂණයෙන්, අසාධාරණයෙන්, බලපෑම් කිරීමෙන් සලකුණු වූ යුද්ධයක් බඳු ය. සමස්ත සමාජය ම මේ සත්‍යය දනී. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති අයිතිය සැබෑ ලෝකයේ දී සිහිනයක් පමණි.

රාජ්‍යයන් වැඩි ම සංඛ්‍යාව අත්සන් තබා ඇති මානව හිමිකම් ලේඛනය ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියයි. එහෙත් අපේ රට ද ඇතුළු සෑම රටක ම දරුවන් බහුතරයේ කතාව ශෝචනීය එකකි. ලෝ පුරා ළමයි මිලියන 250ක් බෙහෙවින් කටුක අමානුෂික පරිසරයක අවිධිමත් රැකියාවල නිරත වී සිටිති. දරුවන් දිවි රැකගැනීම සඳහා ශ්‍රමය විකිණීම ශිෂ්ඨ සමාජයක කිසි සේත් නොවිය යුත්තකි. බොහෝ රටවල ළමයින්ට එරෙහි හිංසනය මනුෂ්‍යත්වයට නිගාදෙන මට්ටමක පවතී. දරුවෝ නිති පතා ම අත්හැර දමනු ලැබීමට, පහර දීමට පමණක් නොව ඝාතනයට ද ලක්වෙති. මේ ඛේදවාචකය පිටුපස ඇති ප්‍රධාන සාධකය අසාධාරණ ආර්ථික සමාජ ක්‍රමය වන්නේ ය.

මානව හිමිකම් මහා පරිමාණයෙන් උල්ලංඝනය කරන්නා වූ යුද්ධ දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු අවසන් වනු ඇතැයි එකල විශ්වාසයක් ඇති විය. එය යථාර්ථයක් වූයේ නැත. සෝවියට් දේශය බිඳ වැටී නිරවි යුද්ධය අවසානයකට පැමිණි විට ලෝකය යුද බියෙන් තොර සාමකාමී තැනක් වනු ඇතැයි බොහෝ විද්වත්හු විශ්වාස කළහ. එය ද සිහිනයක් විය. මෑත භාගයේ වඩාත් අසාධාරණ සහ වඩාත් කුරිරු යුද්ධ ඇති වූයේ නිරවි යුද්ධයේ නිමාවෙන් පසුව ය. අද මැදපෙරදිග කලාපය මළ ගෙයක් බඳු ය.

ඉහත සඳහන් කළේ වත්මන් ලෝකයේ මානව හිමිකම් පිළිබඳ කටුක යථාර්ථයෙන් බිඳක් පමණි. නීති සම්පාදනය කළ පමණින් මානව හිමිකම් භුක්ති විඳීමට අවශ්‍ය පරිසරය නිර්මාණය නොවන බව තේරුම් ගැනීමට එය ප්‍රමාණවත් ය. මානව හිමිකම් රාජ්‍යයන්ට බලපෑම් කිරීමේ මෙවලමක් ලෙස භාවිත කරන ජාතීන් සහ මානව හිමිකම් ජීවනෝපායක් කරගෙන සිටින සිවිල් සමාජ සංවිධාන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පමණක් හුවා දක්වන නමුදු ආර්ථික හා සාමාජයීය අයිතිවාසිකම් අමතක කරති. මාධ්‍ය නිදහස හා තොරතුරු දැන ගැනීමේ අයිතිය සඳහා උද්ඝෝෂණ කරන ඔවුහු වී විකුණා ගැනීමට නොහැකි ව අසරණ වන ගොවීන් ගැන කිසිදු හඬක් නො නගති. සෙසු පීඩිත ජන කොටස් සම්බන්ධයෙන් ද ඔවුන්ගේ ආකල්පයේ වෙනසක් නැත.

මානව හිමිකම් ව්‍යාපාරය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන, සියලු මනුෂ්‍යයන්ට අභිමානයෙන් ජීවත්විය හැකි සමාජයක් නිර්මාණය කිරීමට නම් මනුෂ්‍යයාගේ සැබෑ වුවමනාවන් සපුරාලන ආර්ථික ක්‍රමයක් ඇති කළ යුත්තේ ය. ආර්ථිකයේ ඵලය එය බිහි කිරීමට දායක වන සියලුදෙනා අතර සමානුපාතික ව බෙදී යා යුත්තේ ය. මානව හිමිකම් භුක්ති විඳීමට අවකාශය සලසන ආර්ථික හා සමාජ කොන්දේසි නිර්මාණය කරන්නේ නැතිව මානව හිමිකම් ලේඛන කොතෙක් සම්පාදනය කළ ද අපේක්ෂිත අරමුණට ළඟා වීමට නො පිළිවන. මානව හිමිකම් ව්‍යාපාරයේ තවත් බලවත් ඌණතාවක් තිබේ. ඒ මනුෂ්‍යයාගෙන් සමාජයට ඉටුවිය යුතු වගකීම් මුළුමනින් ම පාහේ අමතක කොට තිබීමය. ඊට ද හේතුව නූතන ලෝකයේ මානව හිමිකම් සුරැකීම සියතට ගෙන සිටින බලවත් ජාතීන්ගේ පරමාර්ථය මානව හිමිකම් තහවුරු කිරීම නොව සිය ලෝක ආධිපත්‍යය අඛණ්ඩව පවත්වාගෙන යාමේ උත්සාහයයි.

